රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 06/2004(1)

මගේ අංකය:EST-9/DICIP/6/55
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07.
2011.12.30 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන්.

**ආයතන සංග්‍රහයේ XLVIII වැනි පරිච්ඡේදය සංශෝධනය කිරීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද 2004.12.15 දිනැති අංක: 06/2004 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධාන පහත සඳහන් සංශෝධනයන්ට යටත්ව තවදුරටත් එලෙසම බලපැවැත්විය යුතු බවට 2011.11.09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී තීරණය කර ඇත.

02. ඒ අනුව දැනට චෝදනා පත්‍ර නිකුත් කර ඇති විනය පරීක්ෂණ වලට අගතියක් නොවන ලෙස ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII පරිච්ඡේදයේ 22:1:1 උප වගන්තිය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

22:1:1 චූදිත නිලධාරියෙකුට විරුද්ධව චෝදනා පත්‍රයක් නිකුත් කර එක් වසරක් ඇතුළත අදාළ පරීක්ෂණය නිම කර විනය නියෝගයක් නිකුත් කිරීමට විනය බලධාරියා අවශ්‍ය පියවර ගතයුතුය. 31:11 උප වගන්තියෙහි සඳහන් චෝදනාවක් නොවන අවස්ථාවක චූදිත නිලධාරියාගේ ප්‍රමාදයක් නිසා පරීක්ෂණය පමාවන අවස්ථාවක දී හැර වෙනත් කරුණක් නිසා එසේ වසරකට වඩා පරීක්ෂණය අවසන් කර විනය නියෝගය නිකුත් කිරීමට ප්‍රමාද වන්නේ නම් චූදිත නිලධාරියා වැඩ තහනමකට ලක් කර ඇත්නම් විනය පරීක්ෂණයේ සඳහන් කරුණු වලට යටත්ව විනය බලධාරියාගේ අභිමතය පරිදි චූදිත නිලධාරියා නැවත සේවයේ පිහිටුවා වැටුප් ගෙවිය හැකිය. එතෙක් නොගෙවන ලද වැටුප පිළිබඳව විනය නියෝගය ලැබීමෙන් පසු එහි සඳහන් පරිදි කටයුතු කළයුතුය.

03. 2010.06.22 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 07/2010 මඟින් සංශෝධිත ආයතන සංග්‍රහයේ XLVIII පරිච්ඡේදයේ 19:5 උපවගන්තියේ විධිවිධාන පරිදි පරීක්ෂණ නිලධාරි සංචිතයක් පවත්වාගෙන යෑම එම පරිච්ඡේදයේම 19:6 උපවගන්තියේ විධිවිධාන අනුව පරීක්ෂණ නිලධාරින්ගේ වෙනම නාමලේඛනයක් පවත්වාගෙන යෑමේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු අයිතියට අගතියක් නොවේ.

පී.බී.අබේකෝන්,
ලේකම්,
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය